**ශීර්ෂය - 234 ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 234 - ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුලි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ශ්රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී  දැනුවත් කරන ලදී.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රකාශ අනුව (SA 92) බැරකම් රු.7,733,665 ක් වුව ද, ගිණුමේ සටහන් (iv) හි බැරකම් පිළිබඳ ප්‍රකාශයේ රු.1,845,655 ක් ලෙස දක්වා තිබුණු අතර 2023 මාර්තු 31 දින වන විට එම මුදල පියවා තිබුණි. | ශ්‍රේෂ්ඨාධිකරණයේ 2022.12.31 දින අනුව පැවති බැරකම් ශේෂය රු.1,845,655 ක් වන අතර, එම අගය බැරකම් පිළිබඳ ප්‍රකාශයේ නිසි පරිදි ඇතුළත් කර ඇති බවත් භාණ්ඩාගාර SA - 92 ප්‍රකාශයේ දැක්වෙන ශේෂය සිගාස් වැඩ සටහනේ ඇති වූ තාක්ෂණික දෝෂයක් මත පැන නැගුණ තත්ත්වයක් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | දෙපාර්තමේන්තු පොත්, භාණ්ඩාගාර පොත් සමග සැසඳීමට වගබලා ගත යුතු වේ. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>මුදල් රෙගුලාසි 880 | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් 21 දෙනෙකු ඇප තබා නොතිබුණි. | ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ නිලධාරීන්ගේ ඇප තැබීම සම්බන්ධයෙන් මෙතෙක් නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නැති බවත්, අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වාර්ෂික ස්ථානමාරු මත නිලධාරීන්ගේ ආයතනික විෂයයන් වෙනස් වූ බැවින්, 2022.12.31 දිනට ඇප තැබිය යුතු නිලධාරීන් ගේ ඇප මුදල් තැබීම ප්‍රමාදවී ඇති අතර, | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | මේ වනවිට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා තිබුණි. | |
| **(ii)** | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br><br>2016.12.29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1ඡේදය | දෙපාර්තමේන්තුවේ සංචිත වාහන 05 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහන පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | වාහන 04 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර ඇති නමුත් කොවිඩ් වසංගත තත්ත්වය, වියදම් කළමනාකරණ චක්‍රලේඛ හා QR සංකේත ක්‍රමය ආදිය හේතුවෙන් ඉන්ධන වියදම් සීමාකිරීමට සිදුවීම මත ඉන්ධන දහන පරීක්ෂාව සිදුකිරීමට නොහැකි බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට වගබලා ගත යුතු ය. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371(1) ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමෙන් පසු අදාල කාර්ය නිමකර දින 10 ක් තුළ අතුරු අග්‍රිම පියවිය යුතු වුව ද අවස්ථා 20 කදී ලබා දුන් රු.1,449,100 ක් වූ අග්‍රිම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම ලබාගෙන නොමැති අතර අත්තිකාරම් ලබාගන්නා නිලධාරීන් දැනුවත් කර ඉදිරියේ දී නිසිපරිදි අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අග්‍රිම පියවිය යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2022 ජනවාරි 01 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම් ශේෂය රු.39,056,664 ක් වුවත්, 2022 ජනවාරි 01 දිනට අත්තිකාරම් 'බී' ගිණුමට අදාළ 'ඒසීඒ 05' ප්‍රකාශය අනුව එය රු.39,124,909 ක් වූ බැවින් 2022 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් 'බී' | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ වර්ෂ 2011 සිට දිගින් දිගටම පැවතගෙන එන ශේෂය නිරවුල් කරදෙන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දන්වා යවා ඇති අතර, භාණ්ඩාගාරය සමග කිහිපවිටක්ම සාකච්ඡා සිදුකරන ලදී.<br>ඒ අනුව රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01 / 2020 හි 1 කොටසෙහි 03 ඡේදයෙහි 3.1 | වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිණුම් ශේෂය භාණ්ඩාගාර පොත්වල ශේෂයට වඩා රු.68,246 වැඩියෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දක්වා තිබුණි. 2021 වර්ෂයේ සිට මෙම වෙනස දිගින් දිගටම පැවතගෙන එන නමුත් එය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වගන්තිය යටතේ ඇති මු.රෙ. 113 (6) හා ඒ යටතේ නිකුත් කර ඇති මාර්ගෝපදේශ 01 අනුව කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | |
| (ආ) | අධිකරණ අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ වාහන 07 ක නීත්‍යානුකූල අයිතිය 2022 දෙසැම්බර් 31 දින වන විටත් පවරාගෙන නොතිබුණි. | අධිකරණ අමාත්‍යාංශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා ලබාදී තිබූ වාහන 07 තාවකාලික පදනමෙන් ලබා දී තිබූ බව දන්වා තිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් 2021 ජනවාරි 17 දින සිට වර්ෂ 02 ක අධික කාලයක් අබලන් තත්ත්වයේ නිෂ්ක්‍රීයව පැවතිය ද අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රේෂ්ඨාධිකරණයට අයත් 300 – 8344 දරන මිට්සුබිෂි ලාන්සර් වර්ගයට අයත් කාර් රථය අළුත්වැඩියා කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ රථවාහන පරීක්ෂා කරනු ලබන යාන්ත්‍රික ඉංජිනේරු මහතා වෙත යොමුකර ඇති බවත් අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට අදාළ ක්‍රියාමාර්ග සිදුකරමින් පවතින බවත් දන්වා තිබුණි. | කඩිනමින් අළුත්වැඩියාවන් සිදුකර වාහන භාවිතයට ගත යුතුය. |
| (ඈ) | සේවය හැර ගොස් ඇති නිලධාරියකුගෙන් අයවිය යුතු රු.175,405 ක ආපදා ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වනවිට සේවය හැරගොස් ඇති නිලධාරියාගෙන් අයවිය යුතු ණය ශේෂ පිළිබඳ ලිඛිතව හා වාචිකව දැන්වීමෙන් පසු 2023 මාර්තු මස පටන් කොටස් වශයෙන් ණය මුදල ආපසු අයකර ගැනීමට පියවර ගෙන ඇති බව දන්වා තිබුණි. | ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වේ. |
| (ඉ) | 2022 වර්ෂය තුළ දී ශ්‍රේෂ්ඨාධිකරණය තුළ නඩු වර්ග 15 කට අයත් විසඳීමට තිබූ මුළු නඩු සංඛ්‍යාව 6678 ක් වූ අතර වර්ෂය තුළ දී විසඳා අවසන් වූ නඩු සංඛ්‍යාව 1196 කි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 18 ක් වූ අතර වර්ෂය අවසානයේ විසඳීමට ඇති නඩු සංඛ්‍යාව 5482 කි.ඒ අනුව වර්ෂය තුළදී නඩු විසඳීමේ ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි. | ශ්‍රේෂ්ඨාධිකරණයේ 2022.01.01 දිනට විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව 5021 ක් වන අතර, 2022 වර්ෂය තුළ අළුතින් ගොනුකරන ලද මුළු නඩු සංඛ්‍යාව 1657 ක් බවත් 2022 වර්ෂය තුළ අවසන් කළ මුළු නඩු සංඛ්‍යාව 1196 ක් බවත් දන්වා තිබුණි. | නඩු නියමිත කාලය තුළ විසඳා අවසන් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ දී අභියාචනාධිකරණය තුළ නඩු වර්ග 23 කට අයත් විසඳීමට ගොනු වූ මුළු නඩු සංඛ්‍යාව 4595 ක් වූ අතර වර්ෂය තුළ දී විසදා අවසන් වූ නඩු සංඛ්‍යාව 1172 කි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 25 ක් වූ අතර වර්ෂය අවසානයේ විසදීමට ඇති නඩු සංඛ්‍යාව 3423 කි. ඒ අනුව අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය තුළ ද නඩු විසදීමේ ප්‍රගතිය අඩු මට්ටමක පැවතුණි. | අභියාචනාධිකරණයේ 2022.01.01 දිනට විසදීමට ඇති මුළු නඩු සංඛ්‍යාව 3563 ක් වන අතර. 2022 වර්ෂය තුළ අළුතින් ගොනුකරන ලද මුළු නඩු සංඛ්‍යාව 1032 ක් බවත්, 2022 වර්ෂය තුළ අවසන් කළ මුළු නඩු සංඛ්‍යාව 1172 ක් වන බවත් දන්වා තිබුණි. | නඩු නියමිත කාලය තුළ විසදා අවසන් කළ යුතු වේ. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත අනුමත මුළු කාර්ය මණ්ඩලය 558 ක් වූ අතර එදිනට සත්‍ය කාර්ය මණ්ඩලය 428 ක් විය. ඒ අනුව නිලධාරින් 130 දෙනෙකු පුරප්පාඩුව පැවතුණි. | පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත හා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්තුමා වෙත ඉල්ලීම් කර ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ගණකාධිකාරි III තනතුර සඳහා වෙනත් දෙපාර්තමේන්තුවක ගණකාධිකරිවරයකු සතියේ දින 02 ක වැඩ බැලීමේ පදනම මත සේවයේ යොදවා තිබුණ අතර එම තනතුර 2022 ජනවාරි 03 දින සිට වර්ෂයකට අධික කාලයක් පුරප්පාඩුව පැවතුණි. | පවතින පුරප්පාඩුව සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත හා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්තුමා වෙත ඉල්ලීම් කර ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩුව කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත භාෂා පරිවර්තක, පුස්තකාලාධිපති, ගිණුම් සහකාර, අධිකරණ ලඝු ලේඛිකා යන තනතුරු වෙනුවෙන් අනුමත කාර්ය මණ්ඩලය පිළිවෙළින් 14,05,15,31 ක් වුවද දෙසැම්බර් 31 දින වන විට එම තනතුරු සඳහා අනුයුක්ත සත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙළින් 08,04,08,16 ක් වූ බැවින් අනුමත සේවක සංඛ්‍යාව හා සැසදීමේ දී | පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත හා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම්තුමා වෙත ඉල්ලීම් කර ඇති බව දන්වා තිබුණි. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | සත්‍ය සේවක සංඛ්‍යාව සියයට 50 කටත් වඩා අඩු මට්ටමක පැවතුණි. | | |
| (ඇ) | අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යලය වෙත අනුමත භාෂා පරිවර්තක තනතුරු 10 ක් වුවද දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා කිසිවකු අනුයුක්ත කර නොතිබුණි. | පාර්ලිමේන්තු කැබිනට් මණ්ඩලයේ අනුමැතියෙන් අධිකරණ අමාත්‍යාංශය මගින් අභියාචනාධිකරණයේ ව්‍යවස්ථාපිත භාෂා පරිවර්තක නිලධාරී ඒකකය මගින් පෙර වර්ෂයන්හි රාජකාරී ආවරණය කරනු ලැබුවද මෙම වර්ෂයේ එම ඒකකය සඳහා මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව දන්වා තිබුණි. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යලය තුල අධිකරණ ලිපිකරු පොත් බැඳුම්කරු තනතුරු වල ඉහළ පුරප්පාඩු ප්‍රමාණයක් පැවතුණු අතර එම ප්‍රමාණය පිළිවෙළින් 10 ක් හා 08 ක් වේ. | අභියාචනාධිකරණයේ ලිපිකරු පුරප්පාඩු වැඩසටහන් සහකාර / සංවර්ධන නිලධාරීන් හා අධිකරණ යතුරු ලේඛක නිලධාරීන් මගින්ද , පොත් බැඳුම්කරු පුරප්පාඩු දැනට සිටින නිලධාරීන් මගින්ද හැකිතාක් දුරට ආවරණය කරනු ලබන බව දන්වා තිබුණි. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |